# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 52 — 1973 මාර්තු 23 වැනි සිකුරාද — 1973.03.23

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 383 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහාවූ අයදුම් පත් ... ... | — |
| බදු බාහිරාදිය විකිණීම ... ... ... | 389 | චෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම... ... | 389 | විවිධ දැන්වීම ... ... ... | — |



## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**අලුත්තරම රජයේ ගොවිපලට පිළිස්සූ ගඩොල් ලක්ෂයක් (1,00,000) කපා පුළුස්සා භාරදීම සඳහා ටෙන්ඩර්**

කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් අලුත්තරම රජයේ ගොවිපලට පිළිස්සූ ගඩොල් ලක්ෂයක් (1,00,000) කපා පුළුස්සා භාරදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1973.04.05 වන පස්වරු 2 වනතෙක් භාරගනු ලැබේ.

(i) ගඩොලක ප්‍රමාණය—$8\frac{3}{4}'' \times 4\frac{1}{2}'' \times 2\frac{3}{4}''$ ක් විය යුතුය.

(ii) ගඩොල් කැපීමට ගොවිපලේ බිම් කොටසක් වෙන්කර දෙනු ලැබේ.

(iii) අවශ්‍ය දර හා පොල් අතු කොහු ලණු ආදිය හා වෙනත් උපකරණ සපයනු ලැබේ.

(iv) පෝරණුවක් හා මඩුවක් සාදා දෙනු ලැබේ.

(v) ගඩොල් දහක් (1,000) කපා වේලා, පෝරණුවට අසුරා, පුළුස්සා දිය හැකි මිල ගණන ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කළ යුතුය.

(vi) පුළුස්සා භාරදෙනු ලබන සෑම ගඩොල් දසදහසකට (10,000) කට බැගින් වරින් වර මුදල් ගෙවනු ලැබේ.

(vii) කොන්ත්‍රාත්කරු විසින් අවශ්‍ය ගඩොල් තොගය 1973.06.30 වන දිනට පෙර පුළුස්සා නිමකර භාරදිය යුතුය.

(viii) මනාව පිළිස්සුනු නැති නුසුදුසු ගඩොල් ප්‍රතික්ෂේප කිරීමේ බලය ගොවිපල කළමනාකරු සතුය.

(ix) කොන්ත්‍රාත්කරු විසින් මෙම කොන්ත්‍රාත්තුව අලුත්තරම රජයේ ගොවිපලේ කළමනාකරුගේ නියමයන්ට අනුකූලව ඉටුකළ යුතුය.

2. කුණ්ඩසාලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයෙන් ලබාගන්නා ලද පෝරමවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

---

### සැලකිය යුතුයි

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදවල පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.**

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

පීඑස් සී. 2/1/73.

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### අසරණ පාසැල් ළමයින් සඳහා ඇස් කණ්ණාඩි සැපයීම පිණිස ටෙන්ඩර් භාර ගැනීම

පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන පරිදි 1973 මුදල් වර්ෂය තුළ අසරණ පාසැල් ළමයින් සඳහා ඇස් කණ්ණාඩි සැපයීම පිණිස 1973. 04. 27 දින පූ. භා. 10 දක්වා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් දේශීය නිෂ්පාදකයින් ගෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් විසින් තමන් විසින්ම සකස් කළ ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් සම්පූර්ණ කොට කවරවල බහා මුද්‍රා තබා "අසරණ පාසැල් ළමයින් සඳහා ඇස් කණ්ණාඩි සැපයීම පිණිස ටෙන්ඩර් පත්‍ර" යනුවෙන් කවරයේ වම් කෙළවර මුදුනේ සඳහන් කොට කොළඹ 10, තැ. පෙ. 584, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර ඉහත 2 වැනි ඡේදයේ ලිපිනය සඳහන් ස්ථානයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ (ගිණුම් අංශයේ) තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීමට හෝ ලේඛනගත තැපෑලෙන් එවීමට පිළිවන. ලේඛනගත තැපෑලෙන් එවීමට අකමැති ටෙන්ඩර්කරුවන් තමන්ම හෝ ඔවුන්ගේ නියෝජිතයින් මගින් සැපයීම් විස්තර නම සහ ලිපිනය සඳහන් මුද්‍රා සහිත කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර ඉහත 2 වැනි ඡේදයේ ලිපිනය සඳහන් ස්ථානයේ එවැනි ටෙන්ඩර් භාර ගැනීමට බලයලත්, ප්‍රධාන ගණකාධිකාරී වෙත පුද්ගලිකව භාරදිය යුතුයි. මුද්‍රා සහිත ටෙන්ඩරය භාර දෙන්නාට ඔහු විසින් ටෙන්ඩරය භාරගත් බවට දැනුම් දීමේ කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

4. රුපියල් 100 ක මුදලක් කච්චේරියක (කොළඹ කච්චේරියේ) හැර හෝ කොළඹ ඩීන්ස් පාරේ අංක 355 හි රජයේ බෙහෙත් ගබඩා අධිකාරී කාර්යාලයේ තැන්පත් කළ යුතුයි. මුදල් තැන්පත් කළ බවට ලද රිසිට් පත ටෙන්ඩරයට ඇමිණිය යුතුයි.

5. ටෙන්ඩර් භාරදීමෙන් පසු ටෙන්ඩර් අස්කර ගැනීමට ඔවුනට ඉඩ දෙනු නොලැබේ.

6. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හේතු නොදක්වා ඉවත දැමීමට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයට බලය ඇත. මෙම දැන්වීමේ සඳහන් සියළුම කොන්දේසි සම්පූර්ණ ලෙස පිළිපැද නොමැති කිසිම ටෙන්ඩරයක් සලකා බලනු නොලැබේ.

7. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ පාසල් වෛද්‍ය නිලධාරීන් ඇස් කණ්ණාඩි නිකුත් කිරීම සඳහා ඇණවුම් කරන අතර ගෙවීම් කරනුයේ අධ්‍යාපන අධ්‍යක්ෂ විසිනි.

8. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් නියමිත කාලසීමාව තුළදී කණ්ණාඩි සැපයීමට අසමත් වුවහොත් ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කරන අතර වැඩිදුරටත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරනු පිණිස බලය ලත් නිලධාරි තැනට වාර්තා කරනු ලැබේ.

9. සියළුම ටෙන්ඩර්කරුවන්ට ඉහත 2 වැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී, නියමිත දින, නියමිත වේලාවට, ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් මෙන්ම ඉල්ලුම් කොට ඇති මිළ ගණන් ද පැමිණ ඇති ටෙන්ඩර් කරුවන්ට ප්‍රකාශ කරනවා ඇත. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී යම් ටෙන්ඩරයක් නිරීක්ෂණය කිරීම සඳහා ඉල්ලුම් කරන ටෙන්ඩර් කරුවෙකුට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙතින් පිළියෙල කොට ගත් අවස්ථාවකදී ඕනෑම ටෙන්ඩරයක අනු පිටපත නිරීක්ෂණය කිරීමට ඉඩ දෙනු ලැබේ.

එන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1973 මාර්තු 13 දින,
කොළඹ රජයේ බෙහෙත් ගබඩාවේ දී ය.

### SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* |
|---|---|
| 1 .. | Spectacles for simple myopic and hypometronic correction—with locally manufactured frames which should be reinforced with wire inside. |
| 2 .. | Spectacles for simple and compound myopic and hypometropic astigmatic correction—with locally manufactured frames which should be reinforced with wire inside. |

*Note.*—The frames should conform to requirements and be well fitting and the glasses should be properly fixed.

*Prices.*—The prices quoted should be per pair inclusive of spectacle case and "cleaner" in respect of each item 1 and 2 and should also include the cost for packing. "Service" labels will be provided by the Officers when placing the orders to enable despatch by post.

*Samples.*—Samples (not returnable) of frames offered should be sent direct to the Superintendent, Civil Medical Stores, 355, Deans Road, Colombo, on or before the closing date of tenders and should be marked "Samples, Spectacles for Needy School Children, 1972."

3–957—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට අවශ්‍ය පහත සඳහන් මෙරට නිෂ්පාදිත ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් (ලිපිනය : දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, තැ. පෙ. 355, කොළඹ 10,) 1973 අප්‍රේල් මස 25 වැනි බදාදා පෙ. ව. 11 තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරුවකු විසින් ඉහත සඳහන් සේවා භාරගැනීමට හා හරියාකාර ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව අවශ්‍ය වුවහොත් ඔප්පු කිරීම පිණිස ඒ සම්බන්ධයෙන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුය.

3. මරදානේ දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝරම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් එක භාණ්ඩයකට රු. 250 බැගින් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1973 අප්‍රේල් මස 21 වැනි සෙනසුරාදා පෙ. ව. 11 තෙක් ටෙන්ඩර් පෝරම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1973 අප්‍රේල් මස 25 වැනි බදාදා පෙ. ව. 11.05 ට දුම්රිය සාමාන්‍යාධි කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

### අවශ්‍ය ද්‍රව්‍ය භාණ්ඩ

1. තීන්ත වර්ග.
2. මයිසිකල් කොටස්.
3. ගිනි නිවීම සඳහා අවශ්‍ය උපකරණ.
4. සනීපාරක්ෂක ද්‍රව්‍ය යනාදිය.
5. ඖෂධ වර්ග.
6. සම් භාණ්ඩ.
7. පහන් තිර යනාදිය.
8. රබර් නිෂ්පාදන.
9. පී.වී.සී. පයිප්ප සහ කොටස්.
10. බී.ආර්.සී. ෆැබ්රික්ස්.
11. ගැල්වනයිස් යකඩ බඳු.
12. පිත්තල අගුලු.
13. පිත්තල සහ වානේ සරනේරු.
14. ඇස්බැස්ටස් තහඩු.
15. බල්බ් සහ ටෝර්ච්.
16. කොහු භාණ්ඩ.
17. බුරුසු කොහු යනාදිය.
18. වැලි කඩදාසි යනාදිය.
19. කපු ද්‍රව්‍ය (කොට්ට උර, ඇඳ ඇතිරිලි, තුවා බැනියන් යනාදිය.)
20. ලිපි ද්‍රව්‍ය.
21. වතුරට ඔරොත්තු දෙන කබා යනාදිය.
22. විවයින් භාණ්ඩ.
23. මුරුච්චි ඇන යනාදිය.
24. කම්බි ඇන යනාදිය.
25. පිත්තල සහ යකඩ ඇන යනාදිය.
26. කුෂන් රෙදි යනාදිය.
27. ලෝහ භාණ්ඩ.
28. ගෘහ භාණ්ඩ.

එම්. සජීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
1973 මාර්තු මස 12 වෙනි දින,
කොළඹ 10.

8–926—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

11. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ, ටෙන්ඩරයක හෝ ටෙන්ඩර්වල කොටසක් පමණක් පිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

12. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට සති තුනක් තුළ භාරගැනීම සඳහා තම ටෙන්ඩර් පත්‍ර විවෘතව තැබීමට ටෙන්ඩර් කරුවන්ට සිදුවේ.

13. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟවන අතර ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අයගෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිත වූ ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතරම එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක් බව අදහස් කෙරෙන අතර, එවැන්නක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූල වූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු කෙරෙහි එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම් කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත, චැක්රෝල් පොත් පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියකුට ඒවා පරීක්ෂා කර බැලීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැවුවහොත් හෝ ඔහු අතටම භාර දුන්නා සේ සලකනු ලැබේ.

15. කොන්ත්‍රාත්කරුවෙකු විසින් සේවයේ යොදවන කම්කරුවෙකු විසින් වර්ෂ 1934 අංක 19 වෙනි කම්කරු වන්දි ආඥාපනතෙහි (117 වෙනි අධිකාරය යටතේ) ඉල්වනු ලබන වන්දියකින් රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

16. කිසියම් සේවකයෙකු සේවයේ යෙදවීමට අහිතකර යයි රජය සලකනු ලබන විටක හා කිසියම් සේවකයෙකු කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීමට විරුද්ධවීමේ අයිතිය රජය සතුවේ.

17. තනි වශයෙන් හෝ වෙනත් අයෙකුගේ නමක් සමග රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයෙහි නම් සඳහන් කිසිවෙකු සමග හෝ තමාට සැහේ යයි හැඟියන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධ වන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. එහි එකී ගොවිපළවල කළමනාකරුවන්ගෙන් මේ සම්බන්ධ වැඩි විස්තර ලබාගත හැක.

එච්. ඊ. නානායක්කාර,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල).

3–872—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තු—ගොඩනැගිලි තැනීම

පහතින් දැක්වෙන ගොඩනැගිලි තැනීම සඳහා කොළඹ 2, කිව් පාරේ, වන සංරක්ෂක විසින් 1973 අප්‍රේල් මස 10 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

1. අඩවි වන නිලධාරි නිවාසය—හබරණ.
2. අඩවි වන නිලධාරි නිවාසය—කඹුරුපිටිය.
3. වන රක්ෂක නිවාසය—හසලක (මහනුවර).
4. වන රක්ෂක නිවාසය—කලුපහන (හපුතලේ).

2. කොළඹ 2, කිව් පාරේ, වන සංරක්ෂණ කාර්යාලයේ අංක 11 දරණ කාමරයේ ජ්‍යෙ.ස.ව.සං. ඇල්. සී. ඒ. ද ඇස්. විජේසිංහ මහතාගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුවේ. එම ටෙන්ඩර් වන සංරක්ෂක කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි. එසේ නැත්නම්. නියමිත දින හෝ ඊට පෙර ලැබෙන පිණිස කොළඹ 2, කිව් පාරේ, වන සංරක්ෂක වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

සෑම ටෙන්ඩර් ආකෘති පත්‍රයක් සඳහාම කොළඹ, යෝර්ක් වීදියේ ලංකා බැංකු ශාඛාවේ අංක 34 ගිණුමේ වන සංරක්ෂක නමට රු. 100 ක් තැන්පත් කොට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා එම රිසිට් පත ඉදිරිපත් කළ යුතුවේ. එක් විෂයයක් සඳහා එක ටෙන්ඩරය බැගින් ඉදිරිපත් කළ යුතුවේ. 1973 අප්‍රේල් මස 9 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත් ලබාගත හැක.

3. වැඩිමනත් විස්තර සැලසුම් හා ප්‍රමාන පත්‍රිකා රාජකාරි වේලාවන් හිදී, කොළඹ 2, කිව් පාරේ, වන සංරක්ෂක කාර්යාලයෙන් හෝ ත්‍රිකුණාමලයේ, ගාල්ලේ සහ නුවරඑළියේ දිසා වන නිලධාරි කාර්යාලවලින් ලබාගත හැක.

ඇල්. සී. ඒ. ද එස්. විජේසිංහ,
වන සංරක්ෂක වෙනුවට.

වන සංරක්ෂණ කාර්යාලය,
තැ. පෙ. 509, කිව් පාර, කොළඹ 2.
1973 මාර්තු මස.

3–873—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

පහත සඳහන් සැපයීම් සඳහා එක් එක් සැපයීම ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

| සැපයීමේ විස්තරය | අවසන් වන දිනය |
|---|---|
| (1) තුත්තනාගම් කුට්ටි | ... 1973 මැයි 03 දින |
| (2) පයිප්ප සෑදීම සඳහා අච්චු | ... 1973 මැයි 10 දින |
| (3) මිනිරං කෝව | ... 1973 මැයි 15 දින |

එක් එක් සැපයීම සඳහා රු. 100 ක ආපසු ලබා ගත හැකි තැන්පත් මුදලක් ගෙවීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පෝරම කොළ මෙම කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් අවසන් වන දිනයන්ට පෙර දින දහවල් 12 න් පසු භාරගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පත්, එක් එක් ටෙන්ඩරය සඳහා රු. 5 ක් ගෙවීමෙන් ලබා ගත හැක.

මිලට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
242, හැව්ලොක් පාර, කොළඹ 5.

3–888—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

සේද ඔගන්සයින් නූල් සැපයීම සඳහා, ඒවා නිපදවන්නන්ගෙන් හා ඔවුන්ගේ නියෝජිතයින්ගෙන් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973. 5. 3 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. වැඩි විස්තර සහ ටෙන්ඩර් පත් සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය : 3/1 (2/17)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973. 3. 10.

3–912—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වේදිකාවලට කිරුම් යන්ත්‍ර සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයින්ගෙන් 1973 අප්‍රේල් මස 9 වන දින පෙ. ව. 10 තෙක් මිල ගණන් කැඳවනු ලැබේ.

| විස්තර | | ප්‍රමාණය |
|---|---|---|
| (අ) කිලෝගෑම් 250 ක් දක්වා බර කිරීමට වේදිකා කිරුම් යන්ත්‍රයක් | ... | 31 |
| (ආ) කිලෝග්‍රෑම් 500 ක් දක්වා බර කිරීමට වේදිකා කිරුම් යන්ත්‍රයක් | ... | 2 |

2. සියලුම මිලගණන් 1973.4.9 වෙනි දින පෙ ව. 10ට හෝ ඉන් පෙර ඉහත සඳහන් ලිපිනයට එවිය යුතුයි.

3. ලියුම් කවරයේ වම් කෙළවරේ උඩ "වේදිකා කිරුම් යන්ත්‍රවලට මිළ ගණන්". යනුවෙන් සඳහන් කර තිබිය යුතුයි.

සෝමපාල ගුණධීර
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය : 3/1—(3/36)
1973 මාර්තු මස 10 වන දින,
කොළඹ 1,
හේමාස් ගොඩනැගිල්ලේ,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දී ය.

3–909—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කුරුණෑගල කැඳ ඇඹිමේ ආයතනයේ ළිඳක් තැනීම සඳහා කොළඹ හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973.4.9 වන දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 15,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 25.00 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1973.4.8 වන දින පෙ. ව. 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචි ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතුවේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(1/38),
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973 මාර්තු මස 12 වන දින.

3–911—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කෑගල්ල කොට්ඨාශය

#### පාවිච්චි කරන ලද එක්ස්රේ පටල විකිණීම

කෑගල්ල දිස්ත්‍රික්ක රෝහලේ ඇති පාවිච්චි කරන ලද එක්ස්රේ පටල රාත්තල් 1500 ක් විකිණීම සඳහා කෑගල්ල සෞඛ්‍ය සේවා අධිකාරී විසින් 1973 අප්‍රේල් මස 24 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා දිවයිනේ ඕනෑම කච්චේරියක රු. 25.00 ක් තැන්පත් කළ බවට නිකුත් කරන ලද කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුය. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීම සඳහා මුද්‍රිත ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ. ටෙන්ඩර්කරු විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට පිටපත් දෙකකින් යුතුව මුද්‍රාව තබන ලද කවරයක බහා එවිය යුතුය. එම කවරයේ වම් පස උඩ කෙළවරේ " පාවිච්චි කරන ලද එක්ස්රේ පටල සඳහා ටෙන්ඩර් " යනුවෙන් සඳහන් කළ යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර ඉහත අංක 1 ඡේදයේ සඳහන් දිනයට හා වේලාවට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ නැත්නම් කෑගල්ල සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. එසේත් නැති නම් මෙම කාර්යාලයයේ ලේකම්/ගණකාධිකාරීට භාර දිය යුතුය.

4. කිසිම ප්‍රශ්නයක් නොමැතිව ටෙන්ඩර් සමහරක් හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ සහ ඉන් එකක් භාර ගැනීමේ අයිතිය රජය සතුය.
මෙම දැන්වීමේ සඳහන් සෑම කොන්දේසියක්ම නොපිළිපැද තිබුණහොත් එවැනි ටෙන්ඩර් සලකා බලනු නොලැබේ.

5. කෑගල්ල දිස්ත්‍රික්ක වෛද්‍ය නිලධාරි විමසීමෙන් පසු මෙම භාණ්ඩ කාර්යාල වේලාවන් තුළ පරීක්ෂා කළ හැක. ටෙන්ඩර්කරු විසින් යම් මැකීමක් හෝ වෙනස් කිරීමක් කර තිබේ නම් එයට ඔවුන්ගේ අත්සන තැබිය යුතුය. ටෙන්ඩර්කරුවන් විසින් මුළු තොග වෙනුවෙන් මිළක් සඳහන් කළ යුතුය.

6. තෝරුණු ටෙන්ඩර්කරු පිළිගත් බව දන්වා දින තුනක් ඇතුළතදී ඉදිරිපත් කරන ලද මිළ ගණන් සම්පූර්ණයෙන්ම කෑගල්ල සෞඛ්‍ය සේවා අධිකාරී වෙත යැවිය යුතුය. මුදල් ගෙවා දින තුනක් අitulata කෑගල්ල රෝහල් භූමියෙන් ඉවත් කර ගත යුතුය.

7. ඉහත සඳහන් 6 වන ඡේදයේ කොන්දේසි අනුව ක්‍රියා කිරීමට අසමත් වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක කරනු ලැබේ. තවත් අවශ්‍ය විස්තර කෑගල්ල සෞඛ්‍ය සේවා අධිකාරීගෙන් ලබා ගත හැක.

සී. ඩී. හේරත්,
සෞඛ්‍ය සේවා අධිකාරී.

1973 මාර්තු 07 දින,
කෑගල්ල සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයයේ දී.

3–822—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ගමනා ගමන මණ්ඩලය

කොළඹ 5, කිරුල පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනා ගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති තැන විසින්, 1973 ජුනි මස 1 වෙනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වූ මාස 19 තුළ, ටයර් පිරවීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් පත්‍රිකා 1973 අප්‍රේල් මස 20 වෙනි සිකුරාදා පෙ. ව. 10 වනතෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් තැන්පත් වශයෙන් රු. 100 ක් ද, ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝරම ගාස්තු වශයෙන් රු. 25 ක් ද ගෙවීමෙන් පසු ටෙන්ඩර් පත්‍රිකා 1973 අප්‍රේල් මස 19 වෙනි බ්‍රහස්පතින්දා ප. ව. 3 වනතෙක් ලබාගත හැක.

වැඩි විස්තර මාගේ කාර්යාලයෙන් දැන ගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

වේරහැර,
බොරලැස් ගමුව.

3–932—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

මගේ අංකය : මහ/කුක/4/7.

**මහනුවර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ**

මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 1973 අප්‍රේල් මස 09 වැනි දින පෙ.ව. 9 දක්වා මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| වැඩෙහි ස්වභාවය | ප්‍රා.ආ.නි. කොට්ඨාශය | | ලියාපදිංචි විය යුතු මුදල රු. |
|---|---|---|---|
| පොල්ගොල්ලේ රජයේ වඩු පාසලේ අලුත් වැඩියාව | පාතදුම්බර | ... | 7,000 |

2. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමූපකාර සමිතිවලටද රජයේ දෙපාර්තමේන්තුවල ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ටද 1973 අප්‍රේල් මස 06 වැනි දින දහවල් 12 තෙක් මහනුවර කච්චේරියේදී ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝරම අපේක්ෂකයින් විසින් ඉහත සඳහන් වැඩ වෙනුවෙන් රු. 10.00 මුදලක් මහනුවර කච්චේරියේදී තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමූපකාර සමිති ටෙන්ඩර් පෝරම සඳහා මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝරම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර කවරයේ වම් පස උඩ කෙළවරේ වැඩයේ නම ලියා තැබිය යුතුයි. ටෙන්ඩර් පෝරම ලේඛනගත තැපැලෙන් නොඑවන්නේ නම් මහනුවර කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි පැමිණ බහා ලිය හැකිය.

5. 1973 අප්‍රේල් මස 09 වැනි දින පෙ.ව. 9 ට මහනුවර කච්චේරියේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර එවැනි කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කරන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළැඹෙන නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ එකඟත්වය ඇතිව නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත් කරුට බලය දිය හැකිය. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතර එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ " අභිප්‍රාය " සඳහා " ලාංකික " යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කරන අතර එවැන්නක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන කම්කරුවන් සෑම කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධ යෙන් දැනට බලපවත්වන හා මින් පසු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූල වූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩය කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චෙක් රොල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ විසින් විධිමත් පරිදි බලය දෙනු ලැබූ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

7. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම් කළ විට මහනුවර දිසාපතිගෙන් ලබාගත හැකිය.

සුදත් ගුණසේකර,
මහනුවර දිසාපති වෙනුවට.

1973 මාර්තු මස 06 වැනි දින,
මහනුවර දිසාපති කාර්යාලයේ දීය.

3–826—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

## බඩු බාහිරාදිය විකිණීම

**රේගු වෙන්දේසියක්**

ලියාපදිංචි අංක 33 ශ්‍රී 1741 දරණ "බෙඩ්ෆෝඩ්" වර්ගයේ ඩිලිවරි වෑන් රථය 1973 අප්‍රේල් මස 03 වැනි දින උදේ 10 ට කොළඹ කොටුවේ නිවාරණ කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1973. 04. 02 වැනි දින කාර්යාල වේලාවන් තුළදී මෙම වෑන් රිය පරීක්ෂා කළ හැකිය.

සාර්ථක ලංසුව තබන්නා විසින් වැඩිම ලන්සුවෙන් සියයට 50 ක් වෙන්දේසිය අවසන් වූ වහාම ගෙවිය යුතුය.

වෙන්දේසියට අදාල වෙනත් කොන්දේසි 1954.05.28 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පලවේ.

පී. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

නි. අ./විකිණීම්,
ශ්‍රී ලංකා රේගුව,
කොළඹ,
1973. 03. 08 වැනි දින.

3–816—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

**අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව**

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ (මැකලම් පාරේ) පිහිටි ප්‍රවාහන අංශයේ ඇති පාවිච්චි කළ පහත සඳහන් වර්ගයන්ට අයත් මෝටර් වාහන දෙකක් 1973 අප්‍රේල් 09 වැනි දින උදේ 10 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබේ :—

| ලියාපදිංචි කළ අංකය | | වර්ගය |
|---|---|---|
| (1) 22 ශ්‍රී 3989 | ... | බෙඩ්ෆඩ් ටොන් 2½ ලොරිය. |
| (2) 22 ශ්‍රී 3868 | ... | බෙඩ්ෆඩ් ටොන් 2½ ලොරිය. |

2. ගැණුම්කරුවන් විසින් එම ස්ථානයේදීම මුදල් ගෙවා වාහන ඉවත් කර ගෙන යා යුතුය. වැඩි විස්තර කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

සී. ඩී. ප්‍රනාන්දු,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1973 මාර්තු 7 දින,
කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ,
බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

3–827—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**රේන්ද බද්ද—කාරෙයිනාගර්, කයිට්ස් පාලම් පාරු සේවය**

1973 අප්‍රේල් 1 සිට 1973 දෙසැම්බර් 31 දක්වා

1973 අප්‍රේල් 1 දින සිට 1973 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ කාරෙයිනාගර් කයිට්ස් අතර පාලම් පාරු සේවයේ රේන්ද බද්ද මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පත් යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් 1973.03.28 වැනි බුද දින පෙරවරු 10 දක්වා යාපනය කච්චේරියේ දී භාරගනු ලැබේ.

2. රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් යාපනය කච්චේරියට භාරදී ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු කච්චේරියෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝරමවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර්පත් පිළියෙල කළ යුතුය. මින් පසු සඳහන් කරනු ලබන ඇප මුදල නියමිත කාල සීමාව තුළදී බැඳීමට හෝ විකිණීමේ කොන්දේසි ඇප බැඳුම්කරය යනාදිය අත්සන් කිරීමට පිළිගත් ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කරනු ලබන අතර, මින් මතු

රජයේ කොන්ත්‍රාත් බදු යනාදිය ලබාගැනීමට නොහැකි වන පරිදි ඔහුගේ නම කොන්ත්‍රාත් පැහැර හරින්නන්ගේ නාම ලේඛණයටද ඇතුළත් කරනු ඇත. අනික් සෑම ටෙන්ඩර්කරුවන්ගේම තැන්පත් මුදල් ජයග්‍රාහක ටෙන්ඩර්කරු විසින් විකිණීමේ කොන්දේසි සහ ඇප බැඳුම්කරය අත්සන් කළ පසු ආපසු ගෙවනු ඇත.

3. සීල් තබන ලද ටෙන්ඩර් පත් 1973.03.28 වැනි දින පෙරවරු 10 ට පෙර, යාපනය මහලේකම් කාර්යාලයේදී කච්චේරියේ මගේ කාර්යාල සහකාර තැන වෙත පැමිණ භාරදීමට ද පුළුවන. සේවයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය කවරයේ පිට සඳහන් කළ යුතුය.

4. 1973.03.28 වැනි දින පෙරවරු 10 ට මගේ කාර්යාල සහකාර තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරන අතර, ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේ ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට ද අවසර දෙනු ඇත.

5. ඉහතින් සඳහන් කර ඇති දිනය හා වේලාවෙන් පසු ලැබෙන කිසිම ටෙන්ඩර් පත්‍ර යලි සලකා බලනු නොලැබේ.

6. කච්චේරියේදී පරීක්ෂා කළහැකි විකිණීමේ කොන්දේසි කෙරෙහි ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයගේ අවධානය යොමු කෙරේ. කාරෙයිනාගර් ජැටියේ සිට කෙලින්ම ඝයිට්ස් දක්වා ගමන් කරන අයවළුන් හැරුණු විට අනික් අයගෙන් කිසිම රේන්ද ගාස්තුවක් අය නො කළ යුතුය.

7. ටෙන්ඩරය මිළදී ගන්නා මුදලින් දහයෙන් එකක් වහාම තැන්පත් කිරීමටත්, එම මුදලින් භාගයක් සඳහා පිළිගත් ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ මිළදී ගත් මුදලින් තුනෙන් එකක් මුදලින් තැන්පත් කිරීමට හෝ ටෙන්ඩරය පිළිගෙන දින දහයක් ඇතුළත පිළිගත් ටෙන්ඩර්කරුට සිදුවනු ඇත.

8. පිළිගත් ටෙන්ඩර්කරු විසින් ඇප බැඳුම්කරය වෙනුවෙන් ඉදිරිපත් කරන දේපලවල ඔප්පු පරීක්ෂාකර බලා ඒ පිළිබඳ සිය අදහස් දැක්වීමටත්, ඇප බැඳුම්කරය පරීක්ෂා කොට තිරවුල් කිරීමටත් ලියකියවිලි පරීක්ෂාකොට, ඇප බැඳුම්කරය පිළියෙල කිරීමත් වෙනුවෙන් රජයේ නීතිඥ තැනට ගෙවිය යුතු ගාස්තුව සඳහා සෑහෙන මුදලක් ද පිළිගත් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළයුතු අතර, දේපොල තක්සේරු කිරීමේ ගාස්තු හා මුද්දර ආඥාපණත යටතේ බැඳුම්කරය වෙනුවෙන් ගෙවිය යුතු මුද්දර ගාස්තුව ගෙවීමටත් ඔහුට සිදුවනු ඇත.

9. ඇප වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සියළු ඔප්පු සමග එකී දේපොළ තිරවුල් බවට ඉඩම් රෙජිස්ට්‍රාර් තැනගෙන් ලබාගත් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය. මෙම සහතිකය ලබාගත යුත්තේ ඇප බැඳුම්කරය ඉදිරිපත් කරන්නාගේ වියදමෙනි.

10. ටෙන්ඩර්පත් කිසිවක් නොලැබුණහොත් හෝ ඉදිරිපත් කොට ඇති ටෙන්ඩර් අසතුටුදායක වුවහොත් ටෙන්ඩර් භාර ගැනීමට නියමිත දින ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් පසුව මෙම බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ඉඩ ඇත.

11. කිසියම් ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් පත් කිසිම ප්‍රශ්නයක් නොමැතිව ප්‍රතික්ෂේප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත සතුය.

12. ටෙන්ඩර් කර ඇති බද්ද නිසි පරිදි කරගෙන යෑම සඳහා පිළිගත් ටෙන්ඩර්කරු විසින් සේවයෙහි යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණකි.

13. ටෙන්ඩර්කර ඇති රේන්ද බද්ද පවත්වාගෙන යාමේදී කම්කරුවන්ම පමණක් සේවයේ යෙදවීම එම බද්දේ කොන්දේසියක් වන අතර, පිළිගත් ටෙන්ඩර්කරු විසින් මෙම කොන්දේසි ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වුවහොත්, එය එකී බද්දේ ව්‍යවස්ථා කඩ කිරීමක් ලෙස සලකනු ලබන අතර, එකී කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට ද ඉඩ ඇත.

කෙසේ වුවද, විශේෂ අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ඒජන්ත විසින් භාණ්ඩාගාරයේ ද එකඟත්වය ඇතිව තමා විසින් කලින් ලියවිලි ලැකින් අනුමත කරන ලද ලාංකික කම්කරුවන් සේවයේ යෙදවීමට අවසරයක් දීමට ඉඩ ඇත. එවැනි ලිඛිත අවසරයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් සේවයේ යෙදවීම තහනම්ය.

14. මේ පිළිබඳ වෙනත් විස්තර යාපනය ආණ්ඩුවේ ඒජන්ත තැනට ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැක.

ඒ. ඒ. ජෝශප්,
යාපනය දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති.

1973 පෙබරවාරි මස 23 වැනි දින,
යාපනය කච්චේරියේ දී ය.

3–807—73.03.23 දින අංක 52 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.**

**ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.**

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.**

### උපලේඛනය

**1973**

| **මාසය** | **පළකිරීමේ දිනය** | **ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව** | |
|---|---|---|---|
| මාර්තු | **73. 3. 2** සිකුරාද ... | **73. 2.21** බදාදා | දවල් **12.00** |
| | **73. 3. 9** සිකුරාද ... | **73. 2.28** බදාදා | දවල් **12.00** |
| | **73. 3.16** සිකුරාද ... | **73. 3. 7** බදාදා | දවල් **12.00** |
| | **73. 3.23** සිකුරාද ... | **73. 3.14** බදාදා | දවල් **12.00** |
| | **73. 3.30** සිකුරාද ... | **73. 3.21** බදාදා | දවල් **12.00** |
| අප්‍රේල් | **73. 4. 6** සිකුරාද ... | **73. 3.28** බදාදා | දවල් **12.00** |
| | **73. 4.11** බදාදා ... | **73. 4. 4** බදාදා | දවල් **12.00** |
| | **73. 4.19** බ්‍රහස්පතින්දා ... | **73. 4.11** බදාදා | දවල් **12.00** |
| | **73. 4.27** සිකුරාද | **73. 4.18** බදාදා | දවල් **12.00** |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලාධිපති.**

**1972 ඔක්තෝබර් මස 20 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.